# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
## தேசிய கல்வி ஆணைக்குழு
## National Education Commission

2022


පළමු මහල, බ්ලොක් 05, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07

1ம் மாடி 5ம் கட்டிடத் தொகுதி பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம் கொழும்பு 07

**1st Floor, Block 05, BMICH, Colombo 07.**

# වාර්ෂික වාර්තාව 2022

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

**වැය ශිර්ෂය 335**

**සභාපතිතුමාගේ පණිවුඩය**



වර්ෂ 2022 දී රටතුළ පැන නැගුණු ආර්ථික අර්බුදකාරී වාතාවරණය සමග සමස්ත ශ්‍රී ලාංකිකයින්ට මුහුණදීමට සිදු වූ විවිධ බාධාකාරී තත්ත්වයන් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වසර තුළ දී අත්පත් කරගත් කාර්යසාධනය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මම ඉතා සතුටු වෙමි.

අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමේ හා වෙනස්කම් සිදුකිරීමේ අවශ්‍යතාව අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තුළින් හඳුන්වාදෙන ලද ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ඇතුළත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) වාර්තාව පිළියෙල කර ගරු අධ්‍යාපන අමාත්‍යවරයා වෙත සහ ජනාධිපති කාර්යාලය වෙත පිළිගැන්වීමට අවශ්‍ය පියවර ගැනීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමත් විය.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතියේ විවිධ අංශ ආවරණය කෙරෙමින් සිදු කරනු ලබන පර්යේෂණවලින් උත්පාදනය වන දැනුම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ කාර්යයන්හි නිරත අනෙකුත් පාර්ශව සහ උනන්දුවක් දක්වන පාර්ශව සමග හුවමාරුකර ගැනීමේ පරමාර්ථයෙන් සංවිධානය කරනු ලබන අධ්‍යාපනය පිළිබඳ පළමු ජාතික පර්යේෂණ සමුලුව, වර්ෂ 2022 දෙසැම්බර් මස 16 දින අධ්‍යාපන ක්ෂේත්‍රයේ විද්වතුන් රැසකගේ සහභාගීත්වයෙන් සාර්ථකව පැවැත්වීමට සමත් විය.

එමෙන් ම, උසස්පෙළ සමත් සිසුවෙකු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගත කරන කාලයත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා උපාධි අපේක්ෂකයෙකු ගත කරන කාලය අවම කිරීම පිළිබඳවත් ගත හැකි ප්‍රගතිශීලී පියවරයන් පිළිබඳව අධ්‍යයනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග සිදු කරන ලද ද්විපාර්ශ්වික අධ්‍යයනයේ වාර්තාව ද ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පිළිගැන්වීමට කටයුතු කරන ලදී. රටතුළ පවතින ශ්‍රම සම්පත කාලීන වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට අනුකූලවන සේ සකස් කර රටේ ආර්ථිකයට දායාද කිරීම කාර්යක්ෂම කිරීමේ අරමුණින් සිදු කළ යුතු වන ප්‍රතිසංස්කරණයන් මෙම අධ්‍යයනය මගින් හඳුනාගෙන ඇත.

ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරගමන්කරුවෙකු වශයෙන් කටයුතු කරනු ලබන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට, අනේකවිධ බාධාවන් මධ්‍යයේ වුවද, තම රට දැය වෙනුවෙන් ඉටු කළ යුතු වූ කාර්යභාරය අඛණ්ඩව, නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකිවීම පිළිබඳව සතුටු වෙමි.



මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2023 ජුනි

# පටුන


| | |
|---|---|
| **පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | **01-06** |
| **පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **07-16** |
| **පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | **17-28** |
| **පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක** | **29-30** |
| **පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | **31-32** |
| **පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ** | **33-34** |
| **පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව** | **35-39** |

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පොදු එකගතාවක් ලැබීම අරමුණු කෙරෙන "අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිසමක්" පිහිටුවීමේ දැඩි අවශ්‍යතාව පිළිගෙන ඇත. "එබඳු කොමිසමක් මගින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය ආරම්භ කළ යුතු අතර 1991 වසර තුළ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇරඹිය යුතුය" යන තරුණයන් පිළිබඳ ජනාධිපති  කොමිෂන් සභා වාර්තාවේ සඳහන් ඉහත කරුණු පාදක කරගෙන හා වරින් වර ඇතිවන දේශපාලන වෙනස්කම් නිසා කෙරෙන බලපෑම් වලින් බැහැර වූ අධ්‍යාපන ක්‍රමයක් සඳහා ස්ථිර හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඒ සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා තිබුණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වන වගන්තිය සහ 2(3) වන වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියලු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

කොමිෂන් සභා පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සංයුතියට අධ්‍යාපනය, පරිපාලනය, කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් ඇති තැනැත්තන් 10 දෙනෙකු සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 05 දෙනෙකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පූර්ණ කාලීන සභාපතිවරයා සහ උප සභාපතිවරුන් දෙදෙනකුන්ගෙන් ද කොමිෂන් සභාව සමන්විත වේ.

වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 8 වැනි කොමිෂන් සභාවයි. (2020.02.28 දින සිට)

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

දේශීය හා ගෝලීය අභියෝගවලට මුහුණදීමට අනුගත වූ සාමකාමී, එකමුතු ශ්‍රී ලාංකීය සමාජයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රගතිශීලීව සහ ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබන්නාවූ සමාජයක්

**මෙහෙවර**

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, අදාළත්වය සහ අධ්‍යාපනයේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමේ අදහසින් අධීක්ෂණ සහ සහතික කිරීමේ භූමිකාවන් සමඟ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, ඉලක්ක, නිපුණතා පැතිකඩ සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ප්‍රමිතීන් සැකසීමේ ප්‍රමුඛතම සංවිධානය ලෙස ක්‍රියා කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් විභා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත  නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටෙක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත  උපදෙස් දීම.

## කොමිෂන් සභාවේ සාමාජිකයින්



**මහාචාර්ය එච්. අබේගුණවර්ධන**
සභාපති



**පද්මිණී රණවීර මිය**
උප සභාපති (ප්‍රතිපත්ති)



**කිංස්ලි ප්‍රනාන්දු මහතා**
උප සභාපති (සැලසුම්)

## නිල බලයෙන් පත්වුණු සාමාජිකයින්



**මහාචාර්ය සම්පත් අමරතුංග**
සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව



**බී.කේ.යූ. වික්‍රමසිංහ මහතා**
සභාපති, තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව



**එම්.එන්. රණසිංහ මහතා**
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය



**ටී.එම්.ජේ. බණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව



**එම්.එම්. නයිමුඩීන් මහතා**
අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## අනෙකුත් සාමාජිකයින්



**ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා**
හිටපු උප කුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය



**ආචාර්ය කපිල බණ්ඩාර මහතා**
පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය



**වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා**
ළමා ස්නායු විශේෂඥ වෛද්‍ය,
රිජ්වේ ආර්යා ළමා රෝහල



**ආචාර්ය ඉන්ද්‍රාණි තලගල මිය**
හිටපු අංශ ප්‍රධානී,
මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය



**ඩී.එම්.ඒ.ආර්.බී. දිසානායක මහතා**
අග්‍රාමාත්‍ය ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය



**ආචාර්ය හර්ෂ අලස් මහතා**
සභාපති, ගේට්වේ ජාත්‍යන්තර පාසල



**ස්වාමිනාදන් විමල් මහතා**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව,
යාපනය විශ්වවිද්‍යාලය

# පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

**හැඳින්වීම**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පවත්නා වැඩසටහන් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඇගයීම.
2. වර්තමාන අවශ්‍යතා අනුව අධ්‍යාපනික ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. පවතින ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්බන්ධව සිදුකරන සමාලෝචන, විශ්ලේෂණ, තක්සේරු කිරීම් හා නවීකරණය මත පදනම්ව ජනාධිපතිතුමා වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්ෂේත්‍ර හතරක් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු හතරක් ස්ථාපිත කර ඇත.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
2. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව.
3. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
4. තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.




සෑම ස්ථාවර කමිටුවක්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 15ක් 20 අතර සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත වේ.

2022 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

### 2.1.1 ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) සංස්කරණය සහ පිටපත් මුද්‍රණය කිරීම




ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත ප්‍රකාරව අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු අධිකාරීන් හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය, ජනාධිපතිවරයා විසින් කලින් කලට ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතුය. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉටු කළයුතු වූ ප්‍රමුඛ කාර්යය සපුරාලමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රධාන ක්ෂේත්‍ර 08ක් ආවරණය වන පරිදි 15 දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුව හා විශේෂඥ කමිටු විසින් මතු සඳහන් කාණ්ඩ 4 අන්තර්ගත කරමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) සම්පාදනය කරන ලදී. එහි අන්තර්ගතය පහත පරිදි වේ.

කාණ්ඩ 1 - ශ්‍රී ලංකා ආර්ථිකය හා ජාතික අධ්‍යාපන ක්‍රමය, මූලික ගැටළු සම්බන්ධ සමස්ත විග්‍රහය
කාණ්ඩ 2 - අධ්‍යාපනයේ දැක්ම, ජාතික අධ්‍යාපන පරමාර්ථ හා ජාතික ඉගෙනුම් නිපුණතා රාමුව
කාණ්ඩ 3 - ජාතික ප්‍රතිපත්ති රාමුවේ අරමුණු හා මගපෙන්වීමේ මූලධර්ම
කාණ්ඩ 4 - උප අංශ - නිශ්චිත ප්‍රතිපත්තීන් හා උපාය මාර්ගික ක්‍රියාකාරකම්

- වෙළුම 1 පූර්ව ළමාවිය අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්
- වෙළුම 2 සාමාන්‍ය අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්
- වෙළුම 3 උසස් අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්
- වෙළුම 4 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්
- වෙළුම 5 පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව
- වෙළුම 6 විශේෂ අධ්‍යාපනය හා පුහුණුව හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්
- වෙළුම 7 නොවිධිමත් අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්
- වෙළුම 8 ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්

**(අ) ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනාව සම්පාදනය කිරීම සහ පිළිගැන්වීම**

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) යටතේ ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සැකසීමට අදාල කර්තව්‍යන්ගෙන් බහුතරයක් සම්පූරණ කර ගැනීමට 2021 වසරේදී හැකි වූ අතර, 2022 වසරේදී එය නිවැරදි ආකෘතියකට ඇතුළත් කර සංස්කරණ කටයුතු සිදු කිරීම පමණක් සිදු කෙරිණි.

**(ආ) උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනාව සම්පාදනය**

උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනාව සැකසීම සඳහා මෙම ක්ෂේත්‍රය පිළිබඳව සිටින විද්වත් කමිටුවක් සම්බන්ධ කරගනිමින් විශේෂඥ කමිටු රැස්වීම් කිහිපයක් භෞතිකව සහ මාර්ගගත ක්‍රමයට පවත්වා, එම විශේෂඥ දැනුම ලබා ගැනීම තුලින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සාර්ථකව සිදු කරන ලදී.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ සවිස්තරාත්මක තත්ත්ව සමාලෝචනයකින් අනතුරුව, ප්‍රතිපත්ති යෝජනාව සහ නිර්දේශිත උපායමාර්ගික ක්‍රියාකාරකම්, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට විශේෂිත වූ මූලික ක්ෂේත්‍ර 11 කට අනුකූලව සකස් කර ඇත. මෙම මූලික ක්ෂේත්‍ර 11ට ඇතුළත් වන්නේ: i) ප්‍රවේශය, සමානාත්මතාවය සහ ඇතුළත් වීම; ii) අධ්‍යයන දින දර්ශනය, විෂය මාලාව සැලසුම් කිරීම, අන්තර්ගතය සහ ඉගෙනුම් ප්‍රතිඵල; iii) ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය සහ ඇගයීම්; iv) ඉගෙනුම ලබන්නන්, ඉගෙනුම් පරිසරය සහ ඉගෙනුම ලබන්නන්ගේ සුභසාධනය; v) මිණුම් සලකුණු කිරීම සහ තත්ත්ව සහතික කිරීම; vi) පර්යේෂණ සහ නවෝත්පාදන, තාක්ෂණය හුවමාරු කිරීම, කලාව සහ සංස්කෘතිය පෝෂණය කිරීම; vii) පෞරුෂ සංවර්ධනය, සිවිල් විඥානය, දේශප්‍රේමීත්වය, සේවා නියුක්තිය සහ ව්‍යවසායකත්ව කුසලතා; viii) උසස් අධ්‍යාපනය සඳහා මුදල් සැපයීම; ix) මානව සම්පත්වල ගුණාත්මකභාවය; x) භෞතික සම්පත් වල ගුණාත්මකභාවය, සහ xi) රෙගුලාසි, සහ පාලනය සහ කළමනාකරණය යන අංග වේ.

මෙම ප්‍රතිපත්ති යෝජනා සහ නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යන ආයතන රාජ්‍ය විශ්වවිද්‍යාල, රාජ්‍ය සහ රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන සමඟ එක්ව ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා වැදගත් වන ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන ව්‍යාපෘති, සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ඇත.

2022 වර්ෂයේ ජූනි මස මස අවසානයේදී සමස්ත යෝජනාවලිය සකස් කර සම්පිණ්ඩනය කර ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) මුද්‍රණය කරන ලදී.

**(ඇ) මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනාව සම්පාදනය**

මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය ඇතුළත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සකස් කර සමස්ත යෝජනා සම්මත කර ජූනි 2022 වන විට මුද්‍රණ කටයුතු අවසන් කරන ලදී.

**(ඈ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා (2020-2030) සම්පාදනය.**



කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා එම ක්ෂේත්‍රයේ විද්වතුන් රැසකගේ දායකත්වය යටතේ සකස් කොට සමස්ථ යෝජනාවලිය සම්පින්ඩණය කොට 2022 වසරේ ජූනි මස වන විට මුද්‍රණ කටයුතු කරන ලදී.

මෙම වාර්තාව 2022 ජූනි මස වනවිට මුද්‍රණ කටයුතු අවසන් කර ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා වෙත භාරදෙන ලදී. මෙම වාර්තාව වර්ෂ 2023 මුල් කාර්තුව තුළ ගරු ජනාධිපතිතුමා වෙත ප්‍රධානය කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය වෙත යොමු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

### 2.1.2 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම



ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පළමු වරට සංවිධානය කරන ලද අධ්‍යාපනය පිළිබඳ ජාතික පර්යේෂණ සමුළුව වර්ෂ 2022 දෙසැම්බර් මස 16 වන දින පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා සහභාගී වූ අතර ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය, ආචාර්ය සුරේන් රාඝවන් මැතිතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ කලාපීය අධ්‍යාපන ප්‍රධානී සෙසු ආරාධිතයින් ලෙස සහභාගි විය. විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්, පීඨාධිපතිවරුන් සහ පළාත් අධ්‍යාපන කාර්යාලවල ප්‍රධානීන් ඇතුලු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය් නියැලී සිටින විද්වතුන් 150කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් උත්කර්ෂවත් අන්දමින් පළමු පර්යේෂණ සමුළුව පැවැත්වුනි.

එහිදී අධ්‍යාපනයේ ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් ආවරණය වන ලෙස එනම්, i මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය ii සාමාන්‍ය අධ්‍යාපනය iii උසස් අධ්‍යාපනය iv තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර නියෝජනය වන අයුරින් නිම කරන ලද පර්යේෂණ වාර්තා 27ක් මෙම පර්යේෂණ සමුළුවේ දී (සමගාමී සැසිවාර දෙකක් අනුව) සභාගත කරන ලදුව එම පර්යේෂණ වාර්තාවල සොයාගැනීම් පිළිබඳව දැනුම හුවමාරු කරගන්නා ලදී. කීර්තිමත් අධ්‍යාපනඥයින් සහ වෘත්තිකයන් විසින් පවත්වනු ලැබූ ප්‍රධාන ආරාධිත දේශන 8 ද පර්යේෂකයින් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ ප්‍රකාශන 27 ද මෙම සැසිවාරයේදී කළඑළි දැක්වීම සිදුවිය.

අධ්‍යාපනය සම්බන්ධයෙන් විද්වතුන් විසින් සිදු කරනු ලබන පර්යේෂණවල දැනුම හුවමාරු කර ගැනීමට සුදුසු වේදිකාවක් තැනීමේ අටියෙන් සංවිධානය කරන ලද මෙම සමුළුව පිළිබඳව අධ්‍යාපනඥයින්ගේ ප්‍රශංසාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට හිමි විය. පළමු ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ ජාතික සමුළුවට අදාළ පර්යේෂණ පත්‍රිකා සංස්කරණය සහ පිටපත් මුද්‍රණය කිරීම සිදුවිය.

**(අ) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ සමීක්ෂණය**

මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනාවේ එක් නිර්දේශයක් වන්නේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, ඒවායේ මුල් ළමාවිය රැකවරණය සහ අධ්‍යාපනය වැඩසටහන් සමාලෝචනය කිරීම සහ සහතික කිරීම සඳහා තත්ත්ව සහතික රාමුවක් සහ ආයතනික යාන්ත්‍රණයක් පිහිටුවීමයි. මෙම සමීක්ෂණයට අදාළව 2022 වසර තුලදී සාකච්ඡා වට කිහිපයක් මගින් සමීක්ෂණ ප්‍රශ්නාවලිය පිළිබඳ මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් දැනුවත් කර, නියමිත පරිදි සැකසූ ප්‍රශ්නාවලිය ඔවුන් වෙත ලබා දී දත්ත රැස්කර ගැනීමෙන් අනතුරුව සමීක්ෂණ කටයුතු 2022 සැප්තැම්බර් අවසාන වනවිට අවසන් කරන ලදී. ඉන් පසු එම අධ්‍යනයේ සංක්ෂිප්ත වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සමුළුවට නිබන්ධනයක් ලෙස ඉදිරිපත් කරන ලදී. එය 2022 වසරේ දෙසැම්බර් මස 16 වන දින පැවති සැසිවාරයේදී මුද්‍රණයක් ලෙස මුද්‍රාහැරීම සිදුකරන ලදී.

**(ආ) ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ STEM/STEAM ව්‍යවහාරයන්ගේ වර්තමාන තත්ත්වය හා ක්‍රියාත්මක වන ආකාරය**



ලෝකයේ බොහෝ රටවල් 21 වන සියවසේ රැකියා වෙළඳපොලේ ඉල්ලුම සපුරාලීම සඳහා කුසලතා ඇති සිසුන් සූදානම් කිරීමේදී STEM/STEAM අධ්‍යාපන ප්‍රවේශය යොදා ගනී. ලංකාව තුළ මෙම අධ්‍යාපන ප්‍රවේශය සම්බන්ධයෙන් යම් ආරම්භයක් ගෙන ඇති නමුත්, තවමත් පාසල් පද්ධතිය තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නැත. එම නිසා මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ, STEM/ STEAM ප්‍රධාන පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය සහ ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම වේ.

ඒ අනුව 2022 වර්ෂය තුළ මෙම පර්යේෂණය සඳහා යොදා ගනු ලැබූ බස්නාහිර, මධ්‍යම හා නැගෙනහිර පළාත් අවරණය වන පරිදි තෝරාගත් පාසල් 1051 ක් සඳහා ප්‍රශ්නාවලි ලබා දී දත්ත රැස් කිරීම සිදු කරන ලදී. තවද, එම දත්ත පදනම් කර ගනිමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වන ලද පළමු, ද්විවාර්ෂික, අධ්‍යාපනය පිළිබඳ ජාතික පර්යේෂණ සමුළුව වෙත පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. 2023 වර්ෂයේ මෙම පර්යේෂණය සඳහා බස්නාහිර, මධ්‍යම හා නැගෙනහිර පළාත් ආවරණය වන පරිදි කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා තුනක් එම පළාත් නියෝජනය කරන විෂය අධ්‍යක්ෂකවරු සමග සිදු කිරීමට අපේක්ෂිත ය. තවද, ප්‍රශ්නාවලි හා කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා තුළින් ලබා ගත් ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත පදනම් කරගනිමින් පර්යේෂණ වාර්තාව 2023 වර්ෂය තුළ දී අවසන් කිරීමට නියමිතව ඇත.

**(ඇ) ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයේ වර්තමාන තත්ත්වය: ගුරුවෘත්තිකභාවය සඳහා වන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ භාවිතයන්**



දිවයින පුරා පිහිටි 1ඒබී, 1සී, දෙවන වර්ගය, තුන්වන වර්ගය යන සියලු පාසල් වර්ග නියෝජනය කරමින් ගුරුවරුන් 2000ක නියැදියක් වෙත තැපැල් මාර්ගික ප්‍රශ්නාවලියක් යොමු කරමින් දත්ත එක්රැස් කරන ලදී. මෙම ප්‍රශ්නාවලිය මගින් ගුරුවරුන් පිළිබඳ මූලික තොරතුරු, ගුරු සංවර්ධනය, ඔවුන්ගේ යෝජනා හා නිර්දේශ පිළිබඳව විමසන ලදී. අධ්‍යාපනය සම්බන්ධ විවිධ පාර්ශවයන් සමග නාභිගත සම්මුඛ සාකච්ඡා පවත්වා අවසන් වාර්තාව සැකසීම 2023 වර්ෂයේ පළමු කාර්තුවේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

**(ඈ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් පිළිබඳ සමීක්ෂණය සහ අධ්‍යයනය**

ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සහ නිර්දේශිත උපාය මාර්ගික ක්‍රියාකාරකම්වල එක් නිර්දේශයක් වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රමිති සැකසීම සහ අධීක්ෂණ පද්ධතියක් ඇතුළත් තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව, මෙම තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණය සකස් කිරීමේ පූර්විකාවක් ලෙස ජාත්‍යන්තර පාසල්වල වත්මන් තත්ත්වය තක්සේරු කිරීමේ අදහසින් ජාත්‍යන්තර පාසල් පිළිබඳ කඩිනම් ඇගයීමක් සිදුකිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තීරණය කරන ලදී. එය ඉටු කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් පිළිබඳ සමීක්ෂණය" නමින් අධ්‍යයනයක් ආරම්භ කෙරිණි.

මෙම අධ්‍යයනය යටතේ 2022 වර්ෂය ආරම්භයේදීම සමීක්ෂණයේ ප්‍රශ්නාවලියේ අවසන් කෙටුම්පත සංශෝධනය කොට එහි විද්‍යාත්මක වලංගුභාවය පරීක්ෂා කර බැලීම සඳහා ක්ෂේත්‍රයට ගොස් නියමු සමීක්ෂණය සිදුකර, එයින් ලද ප්‍රතිඵලවලට අනුව නැවතත් ප්‍රශ්නාවලිය සංශෝධනයට ලක් කර, අධ්‍යනය සඳහා අවසාන ප්‍රශ්නාවලිය සකස් කර ගැනීමට හැකිවිය. මෙම ප්‍රශ්නාවලිය සමග දත්ත රැස්කිරීම ආරම්භ කරමින් නියැදියේ ඇති පාසල් වෙත ක්ෂේත්‍ර චාරිකා යාම ආරම්භ කෙරිණි. එහිදී කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් කිහිපයක් වෙත ගොස් දත්ත රැස් කර ගත හැකි විය. එහෙත් නියැදියේ ඇති සියලුම පාසල් වෙත ක්ෂේත්‍ර චාරිකා ගොස් දත්ත රැස් කිරීමේ කටයුතු කර ගැනීමට නොහැකි විය. මන්ද, රට තුල ඇති වූ ඉන්ධන අර්බුදය හේතුවෙනි. නමුත් මෙම සමීක්ෂණයට අදාළව දිවයින පුරා පිහිටි සියලුම පාසල් වෙතින් දත්ත ලබාගතයුතු නිසා, තැපැල් සමීක්ෂණයක් සිදු කිරීමට තීරණය කෙරුණි.

පසුව, තැපැල් මගින් ප්‍රශ්නාවලිය පාසල් වෙත යැවීම ආරම්භ කරමින් තැපැල් සමීක්ෂණය සිදු කළහ. මෙය සිදු කරන අතරතුර පාසල් බොහොමයක් වෙතින් දත්ත ලැබුන අතර, එලෙස දත්ත නොලැබුන පාසල් වෙත දුරකථන ඇමතුම් ලබාදෙමින් පිළිතුරු ගෙන්වා ගැනීමට කටයුතු කළහ. මින් පසුව දත්ත ගොනු ගත කරමින් දත්ත විශ්ලේෂණයට පහසු වන ආකාරයකට දත්ත ඇතුළත් කර ගැනුණි. මෙලෙස ඇතුළත් කරගත් දත්ත, සමාජ විද්‍යාව සඳහා සංඛ්‍යාන පැකේජය (SPSS) හා මූලික විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කර, මෙම ජාත්‍යන්තර පාසල්වල වර්තමාන තත්ත්වය පිළිබඳ මූලික අධ්‍යයනයක් කර එහි ප්‍රතිඵල මගින් පර්යේෂණ පත්‍රයක් සකසා එය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් 2022 දෙසැම්බර් මස 16 වන දින පැවති ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කරන ලදී. එම තොරතුරු පරීක්ෂණ පත්‍රයක් සේ කෙටුම්පත් කර 2023 වසරේදී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිත වේ. තවද මෙම අධ්‍යයනයේ දිගුවක් වශයෙන් 2023 වසරේදී ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් යාමට අපේක්ෂිතයි.

**(ඉ) තිරසාර උසස් අධ්‍යාපනයක් සඳහා, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ඩිජිටල්කරණය පිළිබඳ අධ්‍යයනයක්**

තිරසාර උසස් අධ්‍යාපනයක් සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කොතෙක් දුරට ඩිජිටල්කරණය වී ඇත්දැයි විමසීම උදෙසා ප්‍රශ්නාවලි 6 ක් මගින් දත්ත රැස් කිරීම . ප්‍රශ්නාවලි 6 සඳහා සිසුන් , ආචාර්යවරු , උසස් කළමනාකරුවන් , පරිපාලන නිලධාරීන් , පුස්තකාල නිලධාරීන් , තොරතුරු තාක්ෂණ නිලධාරීන් සහභාගී වූ අතර සමීක්ෂණ කටයුතු 2022 සැප්තැම්බර් අවසාන වනවිට අවසන් කරන ලදී. ඉන් පසු එම අධ්‍යයනයේ සංක්ෂිප්ත වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු, ද්විවාර්ෂික, අධ්‍යාපනය පිළිබඳ ජාතික පර්යේෂණ සමුළුවට නිබන්ධනයක් ලෙස ඉදිරිපත් කරන ලදී. එය 2022 වසරේ දෙසැම්බර් මස 16 වන දින පැවති සැසිවාරයේදී මුද්‍රණයක් ලෙස මුදාහැරිම සිදුකරන ලදී.

**(ඊ) ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳපොළ සමඟ විශ්වවිද්‍යාල විසින් නිෂ්පාදනය කරන ලද මානව සම්පත්වල අනුකූලතාව විමර්ශනය කිරීම:**
මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ විශ්වවිද්‍යාල සිසුන් බඳවා ගැනීම සහ උපාධිධාරී ප්‍රතිදාන දත්ත විශ්ලේෂණය කිරීම, උපාධිධාරී රැකියා ප්‍රවණතා, උපාධිධාරී රැකියා අනුපාතය සහ තත්ත්ව සහතික සමාලෝචනයේ (Quality Assurance Review) ප්‍රතිඵල අතර සම්බන්ධය සහ විශ්වවිද්‍යාල උපාධිධාරීන් පිළිබඳ සේවා යෝජකයන්ගේ ආකල්ප පිළිබඳ අධ්‍යනය කිරීමයි.

මෙම අධ්‍යයනය අදියර තුනකින් ක්‍රියාවට නංවා ඇත: අදියර I: ද්විතියික දත්ත විශ්ලේෂණය; අදියර II: තත්ත්ව සහතික (QA) සමාලෝචන වාර්තා සමාලෝචනය; සහ අදියර III: උපාධිධාරීන් පිළිබඳව සේවා යෝජකයන්ගේ ආකල්ප අධ්‍යයනය.

අදියර I ට අදාල ද්විතීයික දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ රාජ්‍ය විශ්වවිද්‍යාල යන ආයතන වලින් ද අදියර II ට අදාල දත්ත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලයෙන්ද (QAC/UGC) 2022 වර්ෂය තුලදී එක්රැස් කර ගන්න ලදී. අදියර III සඳහා වන දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කර අවසන් කරන කරන ලදී. මෙම ප්‍රශ්නාවලිය ලංකා වාණිජ මණ්ඩලයේ ලියාපදිංචි සේවා යෝජකයින් 561ක් අතර බෙදා හැර ඇති අතර දත්ත රැස් කිරීම සිදු කෙරෙමින් පවතී.

අදියර I සහ අදියර II හිදී එක් රැස් කරගත් දත්ත පදනම් කරගෙන සංක්ෂිප්ත වාර්තාවක් සකස් කල අතර එය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සමුළුවට නිබන්ධනයක් ලෙස ඉදිරිපත් කරන ලදී. එය 2022 දෙසැම්බර් මස 16 වන දින පැවති අදාළ සැසිවාරයේදී ඉදිරිපත් කල (presentation) අතර එදින එය මුද්‍රණයක් ලෙස බෙදා හරින ලදී.

**(උ) ශ්‍රී ලංකාව තුල වෘත්තීය තාක්ෂණ පුහුණු ආයතනයන් තුල NVQ 5, 6 ඩිප්ලෝමා පාඨමාලාවල සඵලතාවය මැන බැලීමේ පර්යේෂණ අධ්‍යයනය.**
මෙම පර්යේෂණ අධ්‍යයනය ශ්‍රී ලංකාව තුල NVQ 5, 6 ඩිප්ලෝමා ප්‍රධානය කරනු ලබන තෝරාගත් නියදියක රාජ්‍ය අධ්‍යාපන ආයතන පදනම් කොටගෙන 2022 වසරේ දී මැද භාගය වන විට දත්ත රැස් කිරීම අවසන් කරන ලදී. ඉන් අනතුරුව එම අධ්‍යයනයේ සංක්ෂිප්ත වාර්තාවක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පලවු ද්විවාර්ෂික අධ්‍යාපන කමිටුවට නිබන්ධනයක් ලෙස ඉදිරිපත් කරන ලදී. එය 2022 වසරේ දෙසැම්බර් මස 16 වන දින පැවති පළමු ද්විවාර්ෂික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සමුළුව තුළ අදාළ සැසිවාරයේ දී මුද්‍රණයක් ලෙස මුදාහැරීම සිදුකරන ලදී.

### 2.1.3 අධ්‍යාපනය පිළිබඳ දත්ත ඇතුලත් වාර්තාව සැකසීම
ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යානමය දත්ත සංග්‍රහයක් එළි දැක්වීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වර්ෂ 2021 දී ආරම්භ කරන ලදී. කොටස් දෙකකින් යුතු අධ්‍යාපනික දත්ත සංග්‍රහය විවිධ මූලාශ්‍රවලින් රැස් කරගන්නා ලද දත්ත, වගු, ප්‍රස්ථාර ආදිය මගින් මෙම සංඛ්‍යාන දත්ත සංග්‍රහයේ පළමු කොටස සමන්විත වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තෝරාගත් තේමාවක් අනුව සිදු කරනු ලබන විශ්ලේෂණයක් සංඛ්‍යාන දත්ත සංග්‍රහයේ දෙවන කොටසට ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය, ගුරුවරුන් බඳවාගැනීම, ස්ථානගත කිරීම සහ සංවර්ධනය පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් වේ. එහි දී විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ගුරුවරුන් අනුයුක්ත කර ඇති ආකාරය පිළිබඳ විශේෂ විශ්ලේෂණයක් සිදු කරනු ඇත.

මේ වනවිට එම වාර්තාව පිළියෙල කිරීම අවසන් අදියර දක්වා පැමිණ ඇත.

### 2.1.4 වෙනත් ක්‍රියාකාරකම්

**(අ) විශ්ව විද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය සමාලෝචනය**



විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එක්ව සිදු කරන ලද අධ්‍යයනයකි.

විවිධ විෂයයන් සඳහා ලකුණු ලබා ගැනීමේදී එම එක් එක් විෂයයෙහි පවතින දුෂ්කරතා මට්ටමින් උද්ගත වන්නා වූ නොගැලපීම් ඉවත් කිරීමේ සඵලදායී මාර්ගයක් වශයෙන් ලකුණු ප්‍රමිතකරණයේ දී "Z – ලකුණ" ක්‍රමය පිළිගෙන තිබේ. පැරණි හා නව විෂය නිර්දේශයන්ට අදාලව "Z – ලකුණ" ප්‍රමිතකරණය සම්බන්ධයෙන් නොයෙක් විට අධිකරණයේ අභියෝගයට ලක් වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අනවශ්‍ය ප්‍රමාදයන් සහ සංකීර්ණ තත්ත්වයන් ඇති වී තිබේ. තවදුරටත්, මේ සම්බන්ධයෙන් නොසතුටට පත් සිසුන්ගෙන් හා ඔවුන්ගේ දෙමාපියන්ගෙන් බොහෝ පැමිණිලි ඉදිරිපත් වී ඇති අතර විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පොදු මහජනතාව අතර සැකයක් ඇති වීමට ප්‍රේරණයක් වී තිබේ.

ඒ හැරුණුකොට, අපොස උසස් පෙළ විභාගය සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය අතර පවත්නා දිගු කාල පරතරය හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය ප්‍රමාදවීම පිළිබඳ බොහෝ පාර්ශවයන්ගේ අවධානය යොමු වී ඇත. පිළිතුරු පත්‍ර පරීක්ෂාවට දීර්ඝ කාලයක් ගත වීම මෙන්ම ඒවා නැවත පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය සඳහා ආසන්න වශයෙන් මාස 08 ක කාලයක් ගත වීම මෙම ප්‍රමාදයට හේතුවක් බව පෙනේ.

මීට අමතරව ප්‍රාථමික වශයෙන්, සිසුන් දෙවැනි සහ තෙවැනිවර විභාගයට පෙනී සිටීම සඳහා ලියාපදිංචි නොවන පාඨමාලා සඳහා පුරප්පාඩු පිරවීමේදී වාර කීපයක අවශ්‍යතාවක් පැන නැගීමේ ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යයන පාඨමාලා ලියාපදිංචි කිරීම සහ ඒවා ආරම්භ කිරීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල තුළ සිදුවන දිගුකාලීන ප්‍රමාදය පිළිබඳ දැඩි අවධානයක් යොමු වී ඇත.

එම නිසා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අන්‍යොන්‍ය එකගතාවය මත පහත කරුණු පිළිබඳව සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට වර්ෂ 2021 දී ආරම්භ කරන ලද ක්‍රියාවලිය වර්ෂ 2022 දී සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබී ඇත. එකී වාර්තාව වර්ෂ 2022 දී අධ්‍යාපන අමාත්‍යවරයා වෙත පිළිගැන්වීමට කටයුතු කරන ලදී. එකී නිර්දේශයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

**(ආ) සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ විෂයමාලා ක්‍රියාරාමුව**

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදනය කරන ලද ජාතික විෂයමාලා ක්‍රියාරාමුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කරන ලදුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් එකී වාර්තාව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) අනුව සමාලෝචනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලදී.

ඒ අනුව, ජාතික විෂයමාලා ක්‍රියාරාමුව තුළ අධ්‍යාපනයේ දැක්ම, ජාතික අධ්‍යාපන අරමුණු සහ ජාතික අධ්‍යාපන නිපුණතා ක්‍රියාරාමුව සමග අනුගත වෙමින් සාමාන්‍ය අධ්‍යාපනයේ ජාතික විෂයමාලා ක්‍රියාරාමුව සංශෝධන විය යුතු ආකාරය පිළිබඳව නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් සම්පාදනය කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට හැකිවිය. මෙම වාර්තාව ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පිළිගැන්වීමට කටයුතු කෙරෙමින් පවතී.

## 2.2 පවත්නා අභියෝග

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍යකාලීන කාර්යසාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යනයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය අභියෝග පහත පරිදි වේ.

- නිසි පහසුකම්වලින් යුතු ස්ථිර කාර්යාලයක් ලබා ගැනීම.
- අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීම.
- කොමිෂන් සභාව විසින් සිදු කරන ලද උසස් ගණයේ ප්‍රතිපත්ති සහ වාර්තා ක්‍රියාත්මක කිරීමට අදාළ අමාත්‍යාංශ/ආයතන විසින් අවශ්‍ය පියවර නොගැනීම.

## 2.3 ඉදිරි ඉලක්ක

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මධ්‍යකාලීන කාර්යසාධන සංවර්ධන සැලැස්මට අනුව, සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සහ එකී අධ්‍යනයන් සඳහා පහසුකම් සපයන ආයතනික හා පරිපාලනමය ඉදිරි ඉලක්ක පහත පරිදි වේ.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පහසුකම් සහිත නව ස්ථානයක ස්ථාපිත කිරීම.

- ආයතනයේ නව සැලසුම් ඵලදායීව ක්‍රියාත්මක කරලීමට හැකි අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවාගත හැකිවනු පිණිස හා බඳවාගත් නව නිලධාරීන් තවදුරටත් දිගුකාලයක් රඳවාගැනීමට හැකිවන පරිදි බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කරගැනීම හා නිසි පාරිශ්‍රමික දීමනා ගෙවීමට අදාළ අනුමැතීන් ලබාගැනීම.

- දස අවුරුදු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා ජනාධිපතිතුමාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම.

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව තවදුරටත් බලාත්මක කිරීමේ අරමුණින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම. එමගින්, දැනට කිසිදු ප්‍රමිති සහතික කිරීමේ හා වලංගු කිරීමේ ආයතනයක් විසින් සිදුකරනු නොලබන; මුල් ළමාවිය අධ්‍යාපනය, ජාත්‍යන්තර පාසල් අධ්‍යාපනය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රමිති නිශ්චය කිරීම හා එම ප්‍රමිතියට අනුකූලව ක්‍රියාත්මක වන්නේදැයි අධීක්ෂණය කළ හැකි වන පරිදි ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව බලාත්මක කරමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

# පරිච්ඡේදය 03 -වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 ශේෂ පත්‍රය (මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය)

ඒසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 | | සටහන | තත්‍ය 2022 | තත්‍ය 2021 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 60,660,000 | 51,488,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 31,150 | 13,462 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 734,606 | 719,843 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **61,425,756** | 52,221,305 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **61,425,756** | 52,221,305 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 824 | 21,843 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 61,424,932 | 52,199,462 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 33,200,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 30,408,859 | 25,392,352 | ඒසීඒ-2(ii) |
| 27,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 26,037,934 | 22,207,005 | ඒසීඒ-2(ii) |
| 800,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 797,888 | 641,060 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| 61,000,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **57,244,681** | 48,240,417 | |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | - | - | ඒසීඒ-2(ii) |
| 2,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 359,180 | 1,242,517 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 200,000 | හැකියා වර්ධනය | 14 | - | 160,250 | ඒසීඒ-2(ii) |
| 8,300,000 | වෙනත් මූලධන වියදම් | 15 | 4,026,526 | 2,308,137 | ඒසීඒ-2(ii) |
| 11,000,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **4,385,706** | 3,710,904 | |
| | තැන්පතු ගෙවීම් | | 14,350 | 12,662 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 1,496,000 | 588,529 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 1,510,350 | 601,191 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 63,140,737 | 52,552,512 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (1,715,805) | (353,050) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (1,715,805) | (353,050) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | | ඒසීඒ-3 |
| | | | (1,715,805) | (353,050) | |

1

**3.2** – අදාළ නොවේ

## 3.3 ආදායම් ප්‍රකාශය (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය)

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 44,193,169.29 | 46,262,830.00 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 1,992,928.70 | 1,231,270.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **46,186,097.99** | **47,494,100.00** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 1,942,878.70 | 1,198,020.00 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 44,193,169.29 | 46,262,830.00 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 50,050.00 | 33,250.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | |
| මුළු වගකීම් | | **46,186,097.99** | **47,494,100.00** |

පිටු අංක.....7.....සිට ...33... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ..34.... සිට ..39.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023/2/24

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය",
පැලවත්ත - බත්තරමුල්ල.

..........................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
පළමු මහළ, Block 05,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

..........................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :

එම්.ඩබ්. ගයනි චාමලිකා
ගණකාධිකාරි
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
පළමු මහළ, Block 05,
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

2

## 3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතාය | |
|---|---|---|
| | 2022<br>රු. | 2021<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 164,602 | 148,164 |
| අග්‍රිම ලැබීම් | 60,660,000 | 51,488,000 |
| අත්තිකාරම් අයකර ගැනීම | 734,606 | 719,843 |
| තැන්පතු ලැබීම් | 31,150 | 13,462 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **61,590,358** | **52,369,469** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 56,446,793 | 47,599,357 |
| සහනාධාර සහ මාරුකිරීම් | 797,888 | 641,060 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 824 | 21,843 |
| අත්තිකාරම් ගෙවීම | 1,496,000 | 383,643 |
| තැන්පතු ගෙවීම | 14,350 | 12,662 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **58,755,855** | **48,658,565** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **2,834,503** | **3,710,904** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| ගැනීම | 2,834,503 | 3,710,904 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,834,503** | **3,710,904** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(2,834,503)** | **(3,710,904)** |
| **(උ)=( ඇ) + (ඊ)** | | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම | - | - |
| විදේශීය ණය ගැනීම | - | - |
| ප්‍රදානයන් ලැබීම | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාළ නොවේ.

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන රු. | | තත්‍ය වියදම රු. | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| පුනරාවර්ථන | 55,000,000 | 61,000,000 | 57,244,681 | 94 |
| මූලධන | 11,000,000 | 11,000,000 | 4,385,706 | 40 |

## 3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (ප්‍රාග්ධන)

අදාළ නොවේ.

## 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු.,000 රු. | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.,000 රු. | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත රු.,000 | ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9152 | යන්ත්‍රෝපකරණ | 44,193,169 | 44,193,169 | - | - |

## 3.10 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. EDU/C/NEC/FA/2022 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 මැයි 15 දින |

සභාපති,
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

**ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 335 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

2

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**මූල්‍ය නොවන වත්කම්**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ අගය රු. 44,193,169 ක් ලෙස දක්වා තිබු අතර, භාණ්ඩාගාරයේ CIGAS වැඩ සටහන යටතේ එම අගය රු. 46,619,220 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් රු.2,426,051ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම**

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ඇප තැන්පත් ලේඛනය | මුදල් රෙගුලාසි 891 (i) | පවත්වා නොතිබුණි. |
| (ii) | උප පත්‍රිකා පොත් ලේඛණය | මු.රෙ.341 | යාවත්කාලීනකර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැදීම් වලට එළඹීම**

මු.රෙ. 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයට විධිවිධාන සලස්වා ඇති අවස්ථාවල දී හැර වාර්ෂික ඇස්තමේන්තු වල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් මිස කිසිම දෙපාර්තුමේන්තුවක් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමක් හෝ බැදීමකට හෝ නොබැදී සිටිය යුතු අතර, ඒ වෙනුවෙන් දරන බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතුය. එසේ වුවද වැය විෂයයන් 2 කට අදාළ රු. 222,189 කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැදී තිබුණු බව නිරීක්ෂණය විය.

**2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම්**

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන

4

බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්ම හා වර්ෂය අවසානයට කාර්ය සාධනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොමිෂන් සභා පනත සංශෝධනය කර පාර්ලිමේන්තුවේ අනුමැතියට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වනවිට ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණද පනතේ නිර්දේශිත සංශෝධන, නීති කෙටුම්පත් කාර්යාලය වෙත පමණක් ඉදිරිපත් කර තිබූ අතර, 21 වන සියවසට සරිලන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට යන වැඩපිළිවෙල තුළ වසර 30ක් පමණ පැරණි මෙම පනතෙහි අදාළ සංශෝධිතයන් සිදු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(ආ) ශ්‍රී ලංකාවේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරුවිද්‍යාව, සෞන්දර්ය, ගණිතය (STEAM) අධ්‍යාපනය පිළිබඳ පිළිගත් ප්‍රතිපත්ති ලේඛණයක් සැකසීමට සමාලෝචිත වර්ෂයේ ජූනි 30 දින වනවිට සැලසුම් කර තිබුණද, 2022 දෙසැම්බර් මාසයේදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වන ලද අධ්‍යාපනය පිළිබද පළමු ද්විපාර්ශවික ජාතික පර්යේෂණ සම්මන්ත්‍රනයට පර්යේෂණ පත්‍රිකාවක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තියකරණය සඳහා ගුරු අධ්‍යාපනය පිළිබද නිර්දේශිත ජාතික උපාය මාර්ගික රාමුවක් සැකසීමට 2022 අගෝස්තු මාසය වනවිට සැලසුම් කර තිබුණද වර්ෂය අවසාන වන විටත් එම කාර්යයන් සඳහා දත්ත එකතු කරමින් පැවතිණි.

(ඇ) ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 17 ක් ඇතුළත් බහු විධි ක්ෂේත්‍රයන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවට අයත් වන හෙයින් සියල්ලම ආවරණය වන පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් පැවතිය යුතු අතර ඒ සම්බන්ධව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003, 2016 හා 2018 වර්ෂ වලදී නිර්දේශ ඉදිරිපත් කර තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.එය යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා බාධාකාරී සාධකයක් වන බවද නිරීක්ෂණය විය.

(ඉ) 1991 දී මෙම කොමිෂන් සභාව ආරම්භයේ පටන් පැතලි ආයතන ව්‍යුහයක් පැවතීම නිසා ආංශික විශේෂඥ දැනුම වර්ධනය වීමත් සිදු වී නොමැති බව සඳහන් කරමින් ආංශික විශේෂඥ දැනුම හා ආයතනික ඉතිහාස තොරතුරු වැඩිපුර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආයතනය අංශ 04 කට වෙන් කර අභ්‍යන්තර කමිටු දෙකක් පත් කිරීම කර තිබූ නමුත් ඉදිරි ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යයන් 2022 දෙසැම්බර් 31 දින වන විටදී අවසන්ව නොමැති බව නිරීක්ෂණය විය.

T.R.M. W

ටී.ආර්.එම් වීරරත්න

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

6

| ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව. ශීර්ෂය 335 | | |
|---|---|---|
| **අංකය** | **විගණන නිරීක්ෂණ** | **පිළිතුර** |
| 1.6 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම | |
| 1.6.1 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | |
| | මූල්‍ය නොවන වත්කම් | මෙම වෙනස නිවැරදි කිරීම සඳහා භාණ්ඩාගාරය වෙත 2022.10.31 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති අතර එය ඉදිරියේ දී නිවැරදි කිරීමට භාණ්ඩාගාරය මගින් කටයුතු කරනු ඇත. |
| 1.6.2 | ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම. | |
| | (I) ඇප තැන්පත් ලේඛනය | එකඟ වේ. ඇප තැන්පත් ලේඛනයක් ඉදිරියේ දී පවත්වාගෙන යාම සඳහා කටයුතු කරනු ලැබේ. |
| | (II) උප පත්‍රිකා පොත් ලේඛණය | එකඟ වේ. උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| 2 | මූල්‍ය සමාලෝචනය | |
| 2.1 | බැරකම් හා බැඳීම්වලට එළඹීම | වැය විෂය අංක 1404 සඳහා වු වියදම වසර තුළ දී සංශෝධනය වු එකතු කල අගය මත බදු සහ අලුතින් හඳුන්වාදෙන ලද සමාජ ආරක්ෂණ දායකත්ව බදු හේතුවෙන් ඉහල ගොස් ඇත. එමනිසා වසර අවසානයේ ගෙවීමට ප්‍රතිපාදන හිග වූ රු. 166,935.00 ක මුදල ගෙවීම ඉදිරි වසර දක්වා ප්‍රමාද කරන ලදී.<br>වැය විෂය අංක 1301 සඳහා අනුමත ප්‍රතිපාදනය පූර්ණ වශයෙන් උපයෝජනය වී ඇති අතර අංක NA 8919 දරන වෑන් රථයේ රක්ෂණය අලුත්කිරීම සඳහා වූ ගාස්තුව, ඉදිරි වර්ෂය තුළ දී ගෙවීමට තීරණය කරන ලදී. |
| 2.2 | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම | |
| | (අ) | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාමේ අරමුණින් අභ්‍යන්තර විගණන කවයක් පිහිටුවා, අවශ්‍ය පියවර ගැනීමට වර්ෂ 2021 දී කටයුතු කර ඇතත්, වර්ෂ 2022 තුළ ඇති වූ ඉන්ධන හිගය, කඩින් කඩ සේවයට වාර්තා කිරීම වැනි බාධාවන් හේතුවෙන් සක්‍රියව පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. මේ වනවිට, එකී ක්‍රමවේදය සක්‍රියව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත. අදාළ සමාලෝචන වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| | (ආ) | වර්ෂ 2022 තුළ රටතුළ ඇති වූ ඉන්ධන හිගය, කඩින් කඩ සේවයට වාර්තා කිරීම ආදී බාධාකාරී තත්ත්වයන් උද්ගත වීම හේතුවෙන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර එකක් පමණක් පැවැත්වීමට හැකි වී ඇත. |
| 3 | මෙහෙයුම් සමාලෝචනය | |
| 3.1 | කාර්යසාධනය | |

| | | |
|---|---|---|
| 3.1.1 | කාර්යභාරයන් ඉටු නොකිරීම | |
| | (අ) | ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් තිබේ. මෙම පනත පිළිබඳව පූර්ණ අධ්‍යයනයකින් අනතුරුව විශේෂඥ කමිටුවක් විසින් නිර්දේශිත සංශෝධනයන්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම නීති කෙටුම්පත් කාර්යාලය වෙතින් එකී නිර්දේශවල යෝග්‍යතාවය පිළිබඳව විමසා බැලීමට යොමු කර ඇත. ඉන් අනතුරුව, සංශෝධිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, නීති කෙටුම්පත් කාර්යාලයෙන් අදාළ පිළිතුර ලද පසු ඉදිරි ක්‍රියාමාර්ගයක් වෙත යොමු වීමට කටයුතු කරනු ලැබේ. |
| | (ආ) | වර්ෂ 2022 තුළ දී ඇති වූ ඉන්ධන හිගය නිසා රටතුළ විවිධ ක්‍රෙෂ්ත්‍රයන්ගේ පැන නැගුණු ගැටලු හේතුවෙන් සැලසුම් කළ පරිදි පර්යේෂණ කටයුතු සිදු කරගෙන යාමට නොහැකි විය. තැපැල් කාර්යාල සහ පාසල් වසා තැබීම හේතුවෙන් පර්යේෂණ ප්‍රශ්නාවලි බෙදා හැරීම සහ දත්ත එක්රැස් කර ගැනීමට ප්‍රමාදයන් ඇතිවිය. තවද, ප්‍රවාහනයේ දී ඇති වූ දුෂ්කරතා හේතුවෙන් කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා සිදු කිරීමට ද නියමිත පරිදි සිදු කිරීමට නොහැකි වී ඇත. |
| | (ඇ) | වර්ෂ 2022 තුළ දී ඇති වූ ඉන්ධන හිගය සහ කොවිඩ් වසංගත තත්ත්වය තුළ මග හැරුණු පාසල් කටයුතු ආවරණය කිරීම වැනි පාසල් තුළ ඇති වූ කාර්යබහුල වාතාවරණය, තැපැල් වර්ජනය ආදී ගැටලු හේතුවෙන් සැලසුම් කළ පරිදි පර්යේෂණ දත්ත එක්රැස් කිරීමේ කාර්යයන් සිදු කරගෙන යාමට නොහැකි විය. වරින්වර දුරකථනය හරහා විමසීම් සිදු කිරීමෙන් ප්‍රශ්නාවලිය සඳහා දත්ත රැස් කර ගැනීමට සිදු විය. එමනිසා ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තීයකරණය සඳහා ගුරු අධ්‍යාපනය පිළිබඳ නිර්දේශිත ජාතික උපාය මාර්ගික රාමුවක් සැකසීමට 2022 දී නොහැකි විය. |
| | (ඈ) | ලංකාවේ විවිධ වූ අධ්‍යාපන ක්ෂේත්‍ර අතරින් ප්‍රධානතම ක්ෂේත්‍ර අටක් ආවරණය වන පරිදි සකස් කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. |
| | (ඉ) | නව කොමිෂන් සභාව 2020 මාර්තු මස දී රාජකාරි ආරම්භ කිරීමත් සමග කොමිෂන් සභාව ව්‍යුහගත කිරීම, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම යන කාර්යයන් ආරම්භ කරන ලදී. ඒ අනුව, ආයතනික ව්‍යුහය නව මුහුණුවරකින් සකස් කිරීම, බඳවාගැනීම් පරිපාටිය සංශෝධනය කිරීම, සම්මත මෙහෙයුම් කාර්යය පරිපාටිය සකස් කිරීම සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම යන කාර්යයන් අවසන් කර ඇත.<br>කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. එහි සඳහන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුළ අන්තර්ගත කාර්යයන් ඉටු කර ඇත. ඊට අමතර වශයෙන් අභ්‍යන්තර කමිටු තුනක් පත් කර ඇත. කළමනාකරණ කමිටුව, පර්යේෂණ උපදේශක සහ ආචාරධර්ම කමිටුව සහ ප්‍රකාශන කමිටුව වශයෙනි. අවශ්‍ය අවස්ථාවන් හි දී මෙම කමිටුවල දායකත්වය ලබා ගනිමින් කටයුතු කරනු ලබන බව සඳහන් කරමි. |

# පරිච්ඡේදය 04 - කාර්ය සාධක දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධක දර්ශක

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50අඩු % |
| | | අදාළ නොවේ | | |
| | | | | |

# පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීම

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු

සැමට එක හා සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

## 5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග

අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී අදාළ තිරසාර සංවර්ධන (SDG) ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහතික කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2020-2030 වාර්තාව පිළියෙල කිරීමේ කාර්යය 2020 ජූලි මස ආරම්භ කරන ලද අතර තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම පාදක කරගත් ප්‍රතිපත්තිමය නිර්දේශ, මෙම වාර්තාව තුළ අන්තර්ගත කිරීමට සැලසුම් කර ඇත.

ඉලක්කය: අන්තර්කරණ සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතිකකිරීම සහ සැමට යාවජීව ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

5.2.1 වර්ෂ 2030 වනවිට, සියලුම ගැහැනු ළමයින් හා පිරිමි ළමයින් අදාළ සහ ඵලදායී ඉගෙනුම්ඵල කරා ගෙනයන සාධාරණ හා ගුණාත්මක ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන බව සහතික කිරීම.

5.2.2 වර්ෂ 2030 වන විට සියලුම ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධනය, රැකවරණය සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඇති බවට සහතික කිරීම සහ එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම් කරවීම.

5.2.3 වර්ෂ 2030 වනවිට, විශ්වවිද්‍යාලය ඇතුළු දැරිය හැකි සහ ගුණාත්මක තාක්ෂණික, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනය සඳහා සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට සමාන ප්‍රවේශයක් සහතික කිරීම .

5.2.4 වර්ෂ 2030 වනවිට රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය තාක්ෂණික හා වෘත්තීය කුසලතා ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබෙනු ඇත.

5.2.5 වර්ෂ 2030 වනවිට, ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළුව අවදානමට ලක්වූවන් සඳහා අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා තුරන්කිරීම සහ සියලු මට්ටමේ අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.

5.2.6 වර්ෂ 2030 වනවිට, පුරුෂයින් හා ස්ත්‍රීන් යන දෙපාර්ශවයේම සියලුම තරුණ තරුණියන් සහ වැඩිහිටියන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සාක්ෂරතාව සහ ගණිත හැකියාව ලබාගැනීම තහවුරු කිරීම.

5.2.7 වර්ෂ 2030 වනවිට, තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය සහ තිරසාර ජීවනරටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගයකිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය අතුරින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා සියලු ඉගෙනුම්කරුවන් විසින් ලබාගැනීම තහවුරු කිරීම.

# පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 12 | 10 | 02 |
| තෘතියික | 10 | 05 | 05 |
| ද්විතියික | 10 | 07 | 03 |
| ප්‍රාථමික | 10 | 08 | 02 |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

අදාළ නොවේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

වසරේ අවසන් පුහුණු සැලැස්ම පහත පරිදි වේ.

| තෝරා ගත් පුහුණු වැඩසටහන් | ඉලක්කගත කණ්ඩායම | පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ | කාල පරාසය | අපේක්ෂිත නිපුණතා මට්ටම වෙත ළඟා වීම සඳහා වන යාන්ත්‍රණය |
|---|---|---|---|---|
| දෙමළ භාෂා පුහුණු පාඨමාලා | කාර්ය මණ්ඩලය | භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම | පැය 200/150/100 | සමත්වීම |
| සිංහල භාෂා පුහුණු පාඨමාලා | කාර්ය මණ්ඩලය | භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම | පැය 200 | සමත්වීම |
| කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ | කාර්ය මණ්ඩලය | ශ්‍රේණියට අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීම | ශ්‍රේණියට පත්වී වසර 03/05 තුළ | සමත් වීම |
| ඉංග්‍රිසි භාෂා පාඨමාලා | කාර්ය මණ්ඩලය | කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සහ කාර්යයන් පහසු කිරීම | වසර 2/1 | සමත් වීම |
| Hybrid / Auto වාහන සේවා නඩත්තු සම්බන්ධ පාඨමාලා | රියදුරු | දැනුම යාවත්කාලීන කර ගැනීම | දින 3/2 | සහභාගී වීම |
| පරිගණක පාඨමාලා | | දැනුම යාවත්කාලීන කර ගැනීම/ අභ්‍යන්තරික උසස්වීම් සඳහා | අවම වශයෙන් එක් වසරක) සහතිකයක් තිබීම(තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා | සමත් වීම |
| පශ්චාද් අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | වැඩසටහන් නිලධාරී | අභ්‍යන්තරික උසස්වීම් සඳහා | වසර 1 | සමත් වීම |
| අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | අභ්‍යන්තරික උසස්වීම් සඳහා | වසර 1 | සමත් වීම |

# පර්ච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය අනුකූල ) අනුකූල /වේ (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරිනේග් අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | | අදාල නොවේ | අදාල නොවේ |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | අදාල නොවේ | අදාල නොවේ |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | අදාල නොවේ | අදාල නොවේ |
| 1.6 | වෙනත් | කිසිවක් නැත | කිසිවක් නැත | කිසිවක් නැත |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පාලනයට යටත්ව කටයුතු කිරීම | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | අභ්‍යන්තර විගණන අංශයක් නොපැවතීම | අභ්‍යන්තර විගණන අංශයක් නොමැතිවීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා මෙම අවශ්‍යතාව සපුරා ගැනීමට කටයුතු කර ඇත. |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇත දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විමසුම** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | අභ්‍යන්තර විගණන අංශයක් නොමැත. | ඉහත 4.3 පිළිතුර අදාළ වේ. |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | | අනුකූල නොවේ | නිවැරදි කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම | | රැස්වීම් වාර 02ක් පවත්වා ඇත. | 2022 වර්ෂයේ මූලික කාර්ය වූ දස අවුරුදු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සැලැස්ම ජනාධිපතිතුමාට ඉදිරිපත් කර තිබූ බැවින්, එහි ප්‍රගතිය සමග ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම අවශ්‍ය වූ හෙයින් එනෙක් 2022 වර්ෂය තුළ තෙවැනි කමිටු රැස්වීම නොපවත්වන ලදී. |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රල්බයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිදේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල නොවේ | ඉන්ධන හිඟය හේතුවෙන් පරීක්ෂාව සිදුකළ නොහැකි විය. | 2023 වර්ෂයේ සිට නියමිත පරිදි ඉන්ධන දහනය වීම් පරීක්ෂා කිරීම සිදු කෙරේ. |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළයෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | | අදාළ නොවේ. | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | | අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී | අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී | අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | | | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2022 ප්‍රකාරව, සැලසුම් කළ පරිදි පුහුණු අවස්ථා ලබාදීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති විය. |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී | අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී. |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | | |

වයි.ආර්. හේවාසිලියනේග්
වැඩබලන වැඩසටහන් නිලධාරී (මූල්‍ය)
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව